# රුහුණ විශ්වවිද්‍යාලයීය උපකුලපති තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවීම (2022 – 2025)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තිය සහ සංශෝධිත පනත්වල පවතින විධිවිධාන සහ 2020 මැයි 04 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හි විධිවිධාන ප්‍රකාරව රුහුණ විශ්වවිද්‍යාල පාලක සභාව විසින් රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත්/නාමයෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උප කුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයෙකු වේ. ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගණන්දෙන නිලධාරියාවේ. ඔහු/ ඇය පාලක සභාව සහ සනාතන සභාව යනදෙකෙහිම නිලබලයෙන් සාමාජිකයෙකු සහ සභාපතිවරයාද වේ.

විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් පාලක සභාව විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති සහ පියවර ක්‍රියාත්මක කිරීම සහ එකී ප්‍රතිපත්ති වලට යටත්ව විශ්වවිද්‍යාලයේ පරිපාලනය සහ විනය පවත්වාගෙන යාම ඇතුළුව විශ්වවිද්‍යාලය මෙහෙයවීම, අධීක්ෂණය සහ පාලනය සඳහා උපකුලපතිවරයා වගකිවයුතුවේ.

උපකුලපතිවරයා ධූර කාලය ඉකුත්වීමට පෙර ඉවත් වන්නේ නම් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනත ප්‍රකාරව ධූරයෙන් ඉවත් කරන්නේ නම් හෝ හැර වසර 3 ක කාලසීමාවක් හෝ ඔහු/ ඇය හැටපස්වනවිය සම්පූර්ණ කරනතෙක් යන අවස්ථා දෙකෙන් ප්‍රථමයෙන් එළඹෙන කවර හෝ අවස්ථාව දක්වා ධූරය දරනු ඇත.

උපකුලපතිවරයා කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, ක්‍රියාත්මක කරමින් හා හඳුන්වා දෙමින් සහ පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කරමින් ශාස්ත්‍රීය නායකත්වය ලබාදීම, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සිදුකිරීම සඳහා වගකිවයුතු වන අතර, ඒ අනුව ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, පාරදෘශ්‍යභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රීය කළමනාකරණය සහ ඵලදායී අපක්ෂපාතී නායකත්වය යන මූලධර්ම පවත්වාගත යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු සතුව ශක්තිමත් පර්යේෂණ නිපුණත්වයක් ඇතුළුව ඉහළ ශාස්ත්‍රීය කාර්ය සාධනයකින් යුතුව ඉහළ නායකත්ව ගුණාංග සහ විවිධාකාර බාහිර හා අභ්‍යන්තර පාර්ශව සමඟ විෂයානුබද්ධව අන්තර් ක්‍රියාකාරකම් සඳහා අන්තර් පුද්ගල හැකියාවන්, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ නිවැරදි අවබෝධයක් සහිතව තීරණවලට එළඹීමට සහ ඵලදායීලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීමක් තිබිය යුතුය. තවද ඔහු/ඇය සතුව විශ්වවිද්‍යාලීය ප්‍රජාව පිළිබඳ කැපවීමක් ඇතුළුව විශ්වවිද්‍යාලයේ ආචාරධර්ම සහ මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් තිබිය යුතුය.

උපකුලපතිවරයාහට ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයක් ලැබීමට සහ වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක්, නිවාස සහ ප්‍රවාහන පහසුකම් වලට හිමිකම් ඇත.

**අයදුම්පත්/නාමයෝජනා සමඟ පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළයුතුය.**

01. අපේක්ෂිත අයදුම්කරුට / නම්කරනු ලැබූ අයට විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම සඳහා දැක්ම පිළිබඳ ප්‍රකාශයක්, උපකුලපති ධූරයට පත්කරනු ලැබුවහොත් ඔහු/ඇය සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු සහ යෝජනා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සහ අයදුම්කරුගේ උපන්දිනය ඇතුළත් සම්පූර්ණ ජීවදත්ත ඉදිරිපත් කරන ලෙසට දැනුම් දෙනු ලැබේ. (අයදුම්කරු/නම් කරනු ලැබූ අය ශ්‍රීලාංකීය පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු 63 ට නොවැඩි විය යුතුය).

02. නාමයෝජනාවක් නම් නම්කරනු ලැබූ අයගේ කැමැත්ත පළකිරීමේ ලිපිය.

03. අයදුම්කරු / නම්කරනු ලැබූ අය රාජ්‍යසේවයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රුහුණ විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන්නේ නම් අයදුම්කරු/ නම්කරනු ලැබූ අය තනතුරට පත්කරනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළහැකිද යන වග සඳහන් කරමින් සේවා යෝජකයාගේ ලිපියක්.

04. දැනට ධූරය දරන උපකුලපතිවරයා අයදුම්කරුවකු වන්නේනම් හෝ මෙයට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරය දරා ඇත්නම් ඉහත (iii) ඡේදයේ සඳහන් කර ඇති ලිපිලේඛනවලට අමතරව ඔහු/ඇය තම පළමු ධූරකාලය තුළ සාක්ෂාත් කරගත් කරුණු සඳහන් කරමින් වාර්තාවක් ලබා දිය යුතුය.

එක් එක් අයදුම්කරුවන් 2020 මැයි 04 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ අංක 02/2020 හි ඇමුණුම අංක 1 හි දී ඇති ලකුණු ලබාදීමේ පත්‍රිකාවේ නියම කර ඇති උපමාන හා මූලිකාංග ප්‍රකාරව ඇගයීම් කමිටුවක් විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ඇගයීම් කමිටුව විසින් කෙටි ලැයිස්තුගත කරනු ලබන සහ පාලක සභාව විසින් අනුමත කරනු ලබන අයදුම්කරුවන් මිනිත්තු දහයකට (10) නොඅඩු සහ පහළොවකට (15) නොවැඩිවූ ඉදිරිපත් කිරීමක් සිදුකිරීම සඳහා පාලක සභාවේ විශේෂ රැස්වීමක් හමුවට කැඳවනු ලැබේ. සුවිශේෂී තත්වයක් තුළ යම් අයදුම්කරුවකුට ඇගයීම් කමිටුව හමුවට පැමිණීමට නොහැකි වන්නේ නම් ඔහුට/ඇයට වීඩියෝ සම්මන්ත්‍රණය (video conferencing) මගින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවසර දෙනු ලැබේ.

අයදුම්පත් / නාමයෝජනා අදාළ ලිපිලේඛන සමග මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ 2021.08.27 වන දින ප.ව 3.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ අතින් ගෙනැවිත් භාරදීමට හෝ පුළුවන.

අදාළ ලිපි ලේඛන සහිත අයදුම්පත් / නාමයෝජනා බහාලන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ "**උපකුලපති තනතුර**" යනුවෙන් සඳහන් කළ යුතුය.

අවසාන වේලාවට පසුව ලේඛකාධිකාරී කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් සළකා බලනු නොලැබේ.

(අපේක්ෂිත අයදුම්කරුවන් / නම්කරනු ලැබීම් සිදුකරන අයට www.ruh.ac.lk විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය පරීක්ෂාකරන ලෙසට ආරාධනය කරනු ලැබේ.)

**ලේඛකාධිකාරී සහ පාලක සභාවේ ලේකම්,**
**රුහුණ විශ්වවිද්‍යාලය.**
**2021.08.01**

Source: Silumina, Sunday Observer (2021.08.01)